# ලන්ඩනයේ සිංහළ අවුරුදු උත්සව

හවුන්ස්ලෝ ශ්‍රීලංකා ජනහඬ පදනම
මෙහෙයවන බක්මහ උළෙල
**2009 අප්‍රියෙල් 18 වන**
සෙනසුරාදා දහවල් 1 ට ආරම්භවේ.
**Lampton School, Lampton Avenue**
**Hounslow Middx TW3 4EP**

**Heathrow Sri Lanka Community Centre**
(SLSCO) මෙහෙයවන සිංහළ අවුරුදු උළෙල
**2009 අප්‍රියෙල් 4 වන දා**
**Feltham Assembley Hall**
**Hounslow Road, Feltham Middx**

## සිංහළ අළුත් අවුරුදු උත්සවය
**2009 අප්‍රියෙල් 13 වන දා දහවල් 12 සිට**
**East London Buddhist Cultural Centre**
**33 Maybury Road,**
**Plastow, London E13 8RZ**



## ඉඩමක් විකිණීමට

මහනුවර අස්ගිරිය නගර සීමාව තුළ පර්චස් 19 බිම් කැබළි 2 ක් විකිණීමට තිබේ. ජලය, විදුලිය සහ සියළු පහසුකම් සහිතව, බස් පාරට මායිම්ව පිහිටා ඇත. පර්ච් එකක් රු: ලක්ෂ 4 ½ යි
විමසීම් - **0094812215806**



## Marriage Proposal

Parents - Father, Govi Buddhist / Mother, Burgher Catholic, seek professional partner, 28-35 for graduate daughter 27 year old, fair, slim, pretty. Height 5"5, religion immaterial. Serious applicants only please.

**proposedproposals@googlemail.com**



## House share in England

**Single and Double Rooms to rent for weekends, holidays or long tenancy. Shared facilities with quiet mature Asian Professionals. Off street parking.**
**30 minutes from central Liverpool -**
**The European City of Culture.**
**Welcome to picturesque Wirral**
**Contact: Green 07902699574**



SAUNDERS FOOTBALL SUPPORTERS CLUB UK Proudly Presents...

# SAUNDERS NIGHT 2009

IN AID OF SAUNDERS YOUTH ACADEMY
IN SRI LANKA
28th March 2009 At 7:00 PM

**Tickets**
Lihiniya Restaurant - 020 820 82658
Prince of Ceylon - 020 820 82658
Duke Court Travel - 020 874 83535
Colombo Mini Mart: 02089035313

**Tickets**
(inc. meal)
£20 Adults
£10 Children
Under 10 FREE

Music By Exceed and Desmond

**Contacts**
Francis - 078 678 11507
Ranjith - 079 574 90977

Harrow Leisure Centre
Christchurch Avenue
Harrow HA3 5BD



අභාවප්‍රාප්ත අයි. එල්. ආරියසේන මහතා වෙනුවෙන් සිදු කෙරෙන තෙමස් පූර්ණ දානමය පින්කම ලන්ඩන් බෞද්ධ විහාරයේ දී 2009 මාර්තු මස 21 වෙනි සෙනසුරාදා දහවල් පැවැත්වේ. එයට සහභාගිවන මෙන් සියළු නෑදෑ හිත මිතුරන් වෙත කෙරෙන ආරාධනයයි මේ.




මුලතිව් සිට කොටින්ගේ ග්‍රහණයෙන් පැනවිත් දැන් රජයේ කඳවුරක සුරක්ෂිතව සිටින දෙමළ දරුවන් පිරිසකි මේ.

# කරුණාට ඇමති පදවියක්



**දැ**න් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුව සිටින විනයාගමූර්ති මුරලිදරන් හෙවත් කරුණා අම්මාන් මේ නොබෝදා තම පක්ෂය අතහැර ශ්‍රීලංකා නිදහස් පක්ෂයට බැඳුණේය. ඊයේ 9 දා කරුණා ඇමතිවරයෙකු ලෙස අරලියගහ මැදුරේදී දිවුරුම් දුන්නේය. එය ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසංධාන නමැති කැබිනට් නොවන ඇමතිධූරයකි.

තමා දැන් කලින් සිටි **TMVP** පක්ෂය සමග කිසිම සම්බන්ධකමක් නැති බව ඔහු කියයි ශ්‍රීලංකා නිදහස් පක්ෂයට එක්තුවූයේ සබැවින්ම ක්‍රියාකාරී ලෙස දේශපාලනයේ නිරතවීමට බවත් එමගින් දෙමළ ප්‍රජාවගේ යහපතට තමාට කිසිවක් කළහැකි බව විශ්වාස කරන බවත් කීය.

නිදහස ලැබූ කාලයේ සිට ශ්‍රීලංකාවේ විවිධ දෙමළ දේශපාලන පක්ෂව පිහිටවන ලද නමුත් ඒ කිසිවකින් දෙමළ ජනතාවට කිසිදු සෙතක් නොවූ බව කියූ කරුණා මෙලෙස ලොකු දේශපාලන පක්ෂයකට බැඳී දේශපාලනයේ නිරතවීමෙන් ඉදිරියේදී කිසියම් වෙනසක් සිදුවේයයි තමා සිතන බවත් පැවසීය.

ඔහුගේ පක්ෂයට දැන් සිදුවන්නේ කුමක්දැයි ඇසූ කල කරුණා කීවේ එයට කුමක් වුවත් දැන් ඒ ගැන ඔහුගේ කිසිදු තැකීමක් නොවන බවයි. තමා යටතේ සිටි කොටි හටයන් 1300 න් සුදුසු අය හමුදාවට බඳවාගන්නට රජය එකඟවී ඇති බව කී කරුණා දැනටම 300 ක් ශ්‍රීලංකා හමුදාවට බඳවා ගෙන ඇති බව ද පැවසී ය.

♦ ***කේ එල් කරුණාරත්න*** **Sri Lanka**

## ♥ පැටියො ඩාලිං



“ පැටියො අන්න හෙළ උරුමෙ පක්ෂය බ්‍රිතාන්‍යට විරුද්ධ නඩුදාන්න යනවලු ඉස්සර හූරගෙන කාපු ඒවට වන්දි ඉල්ලලා”

“ ගෝඩ්න් බ්‍රවුන් දහ අතේ කල්පනාකරනවා වැටිච්ච බැංකු ටික ගොඩගන්නෙ කොහොමද කියලා... දැන් එහෙනම් කොරේ පිටට මරේ තමයි... වෙන්න යන්නෙ...”

# Sinhala Lesson 131 සිංහළ පාඩම

## සිංහල ඉගෙනීමට පහසු මගක් !

### Causal Verb - ප්‍රයෝජ්‍ය ක්‍රියා

**In the last lesson we explained how the Causal Present was made. This is about:**

**<u>Causal Past Participle</u>**

ලියවූ / ලියවනලද - caused to have been **written**
කැප්පවූ /කප්පවනලද - caused to have **cut**
කැවූ /කවනලද - caused to have **fed**
කරවූ /කරවනලද - caused to have **done**
යැවූ /යවනලද - caused to have **sent**
උයවූ /උයවනලද - caused to have **cooked**

ඔහු අපට පෙන්වූ චිත්‍රපටය ඉතා ප්‍රයෝජනවත්ය.
*The film shown to us by him is very useful*
මාමා සෑදවූ ගෙය ලස්සනයි
*The house that uncle caused to be built is beautiful*
අම්මා උයවූ කෑම රසවත්ය
*The food that mother caused to have cooked was nice.*

**Try to recognise Causative Verbs and Participles in your reading and conversation and also use them in sentences. Turn the following verbs into Causative:**
හිනාවෙනවා කඩනවා එලවනවා ඇවිදිනවා දන්නවා අඬනවා වැඩකරනවා හෝදනවා විකුණනවා මහනවා පදිනවා

♦ ආචාර්යා සුභද්‍රා සිරිවර්ධන
**Dr Subhadra Siriwardane - MA PhD London**

# හරස්පද ප්‍රහේලිකා 106

| | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | | 3 | ■ |
| 4 | | ■ | 5 | 6 |
| 7 | | 8 | ■ | |
| | ■ | 9 | 10 | |
| ■ | 11 | | | |

**හරහට :**
1 තිහෙන් පහළ ගණනක්
4 බිරිඳට මෙසේ ද අමතති
5 සිරුරේ කොතැන හෝ ඇත
7 විසිහතර පැය
9 රැකගන්නට අමාරුය
11 කඩුවෙලට නුදුරු ගමක්

**පහළට :**
1 මෙය නැතිවිට ජීවිතය පල්ය
2 ගැහැණු මායමේ කොටසකි
3 රස කැවිල්ලකි
6 විහාරය
8 ශාරීරික අභ්‍යාස හෙවත් ව්‍යායාම
10 මෙය වැදුණුවිට අත මිට හිහවේ.

***ගියවර නිවැරදි විසඳුම්***
**හරහට :** 1 තණ්හාව 4 නිමල 6 ලපය 8 මත් 9 පිනි 10 මාරුතය
**පහළට :** 1 තවලම 2 හානිය 3 වම 5 ලතෝනිය 7 පත්මා 9 පිත

නේක රසෙන් පිරිපුන්
## සිංහල ඉවුම් පිහුම්

# කොහිල අල ව්‍යංජනය

***අවශ්‍ය ද්‍රව්‍ය :***

| | |
|---|---|
| කොහිල අල | ග්‍රෑම් 500 ක් |
| රතුළුනු | ග්‍රෑම් 100 ක් |
| අමු මිරිස් කරල් | 4 ක් |
| තක්කාලි | ග්‍රෑම් 100 ක් |
| උම්බලකඩ කුඩු | මේස හැඳි 2 ක් |
| මිරිස් කුඩු | තේ හැඳි 1 ක් |
| තුනපහ කුඩු | මේස හැඳි 1½ ක් |
| බදින එළවළු තෙල් | මේස හැඳි 2 ක් |
| දිය කිරි සහ මිටිකිරි | කෝප්ප 1 ක් බැගින් |
| කහ කුඩු ටිකක් සහ ලුණු අවශ්‍ය පමණ | |
| කරපිංචා රම්පෙ කුරුඳු පොතු කැබැල්ලක් | |

***සාදන ක්‍රමය :*** කොහිල අල ශුද්ධ කර හතරැස් කැබලිවලට කපා ගන්න. ඒවා සිහින් දික් අතට ද කපාගත හැකියි. කපාගත් අල සේදීමට පෙර ඉරටු කූරක් ගෙන අල කැබලිවල දවටමින් නූල් ඉවත්කර ගන්න. ඉන්පසු කොහිල අල සෝදා දිය බේරෙන්නට තබන්න. දැන් සාසපානක් ලිප තබා එයට තෙල් දමා රත් වෙන්නට තබන්න.

රතුළුණු අමුමිරිස් ලියා ගන්න. රත්වුණු තෙලට ඒවාද, කරපිංචා, රම්පෙ, කුරුඳු ආදිය එකතු කරන්න. ඒවා බැදීගෙන එනවිට ඊට උම්බලකඩ කුඩු, කහ, මිරිස් කුඩු, තුනපහ කුඩු දමා රන්වන්පාට වන තුරු බැදගන්න. බැදීගෙන එන විට කපාගත් කොහිල අල, තක්කාලි සහ ලුණු එකතු කර ඉන්පසු දියකිරි වත්කර හොඳින් පිස ගන්න. දියකිරි වලින් කොහිල තැම්බෙන විට මිටිකිරි එකතුකර නටවා ඉස්ම හිඳීගෙන එනවිට බාගන්න.

***ගල්කිස්ස මහ හෝටලයේ විධායක සූපවේදී***
♦ ***පබ්ලිස් සිල්වා*** **Sri Lanka**


Sam's
CHICKEN
CHICKEN
CHICKEN
සැමිස් චිකන්
Great Tasting! Great Value!
17 HIGH STREET, WEALDSTONE, HARROW HA3 5BY, TEL: 020 8861 1872
439 HIGH ROAD, WILESDEN, LONDON NW10 2JJ, TEL: 020 8451 7662
84 HIGH STREET, HARLESDEN, LONDON NW10 42J, TEL: 020 8838 2036
246 KINGSBURY ROAD, KINGSBURY, LONDON NW9 9HN, TEL: 020 8204 1432